08 වන පිටුවෙන් (ක්‍රිස්මස් දූපත)

ක්‍රමයෙන් සීමා කිරීමෙන් පසු මෙය ජනගහනය 1200 පමණ දක්වා අඩුවී මෙම දිවයිනේ වත්මන් ජනගහනයෙන් 85% පමණ චීන ජාතිකයන්-ගේද 10% පමණ මැලේ ජාතිකයන්ගෙන්ද ඉතිරිය අනෙකුත් ජාතිකයන්ගේද සෑදී ඇත. ආයිම වශයෙන් බලන වට බෞද්ධයෝය. දඹදිව සිට ගෙන එන ලද ශ්‍රී මහා බෝධි වෘක්ෂයේ ශාඛාවක් මෙහි තිබෙන විහාරස්ථාන භූමියේ සිටුවා ඇත. මැලේ ජාතිකයන් සඳහා මුස්ලිම් පල්ලියක්ද ක්‍රිස්තු භක්තිකයන් සඳහා කතෝලික දේවස්ථානයක්ද මෙහි ඉදිකර ඇත.

ජලය හැරෙන්නට මෙහි ජනයාට අවශ්‍ය සියල්ලම පාහේ පිටින් ගෙන එනු ලබයි. පර්ත් නගරයේ බඩු මිල ගණන් හා සසඳන විට මෙහි භාණ්ඩ මිල එහි මෙන් දෙගුණයක් වෙයි. එළවලු පලතුරු ආහාර පාන , සතියකට වරක් ගුවනින් ගෙන එනු ලබයි. කුඩා සුපිරිවෙළඳ සැල් දෙකක් පමනක් මෙහි තිබේ. භාණ්ඩ සඳහා මෙහි GST බද්ද අය නොකෙරේ. බදු රහිත භාණ්ඩ මිලදී ගත හැකිය.

මෙහි තියෙනුයේ එක් තැපැල් හලක් පමණි. ලියුම් බෙදීමක් නැත. ඔස්ට්‍රේලියාවේ සිට සතියකට වරක් තැපැල එයි.

එහි සොරකම් වාර්තා නොවේ. වාහන සොරකම් ඇත්තේම නැත. වාහන වල යතුරු එය තුළම තබා අගුළු නොදමා ගියද වාහන සොරකම් නොකෙරේ. සෙනසුරාදාට පමණක් චිත්‍රපටයක් පෙන්වන එළිමහන් සිනමා ශාලාවක් මෙහි ඇත.

මෙම දිවයිනේ ස්වභාවය සෞන්දර්යය ගැන කථා කරන විට එහි වනගහණයෙන් 60% වඩා ආරක්ෂිත වනාන්තරයක් බවට පත් කර තිබීම සඳහන් කළ යුතු ප්‍රධාන කරුණකි. ස්වභාවික කොරල් ගල්පර වැටි නිසා දිවයිනට මුහුදු මට්ටමට නැගීමට එරෙහිව ස්වභාවික බාධක වලින් ආරක්ෂාව සැලසේ.

දේශීය පුෂ්පීය ශාක වර්ග 213 ක් මේ දිවයිනේ ඇත. එයින් වර්ග 17 ක්ම මේ දිවයිනට පමණක් අවේණික වු ඒවා වේ.

ගොඩබිම ජීවත්වන කකුලු විශේෂ හා මුහුදු පක්ෂින් මෙහි සුලභව දැකීමට වුවන් සත්වයයෝය. කකුලු වර්ග 20 ක් මෙහි ඇති අතර එයින් වර්ග 13 ක්ම ගොඩබිමේ ජීවත් වෙති. උන් මුහුදට යන්නේ බිත්තර දැමීම හා සංසේචනය සඳහා පමණි. කකුළුවන්ගේ රාජධානිය ලෙස ක්‍රිස්මස් දූපත හැඳන්වීමේ වරදක් නැත. වාර්ෂිකව බිත්තර දැමීම සහ සංසේචනය සඳහා රතු කකුලුවන් මුහුදු වෙරල කරා යන ගමන ස්වභාවධර්මයේ ලෝක පුදුමයක් ලෙස විද්‍යාඥයෝ හදුන්වා දී ඇත. වැහි සමය හා සඳ නැගීමත් සමග මෙම සංක්‍රමණය සිදුවේ. Robber Crab යනු අනෙක් විශේෂ විශාල කකුලුවන්ය.

මුහුදු පක්ෂින් වර්ග 8ක් මේ දූපතේ වෙරලබඩව වාසය කරති. ෆ්‍රිගේට් බර්ඩ් ඇබට්ස්බූබි වැනි පක්ෂිහු මෙහි කූඩු සාදති. දිවයිනට ආවේණික වු මුහුදු සහ ගොඩබිම් කුරුල්ලන් වර්ග 10 න් 7ක්ම මේ දිවයිනට පමණක් විශේෂිත වුවෝ වෙති.

වාර්ෂිකව මුහුදු පක්ෂිහු 80,000 ක් පමණ මෙහි කූඩු සාදන බව ගණන් බලා ඇත. මෙහි කුරුලු වර්ග 53ක් වාසය කරන බව සමීක්ෂණ මගින් හෙළි වී ඇත.

දූපත් පාලනය 1958 ඔක්තෝම්බර් 1 වැනිදා ඔස්ට්‍රේලියාවට පැවරුණ දින පටන් වසරේ ඔක්තෝම්බර් මාසයේ පළමුවැනි සඳුදා දිනය (Territory) ප්‍රාන්ත දිනය ලෙස සමරනු ලබයි.

දෙවැනි මහා ලෝක යුද්ධයේදී දිවයිනේ ආරක්ෂාව පිණිස කාලතුවක්කුවක් බ්‍රිතාන්‍ය ඉන්දියා හමුදා බැරැක්ක අසල වෙරළට ආසන්න කඳු ගැටයක 1941 දී සවිකරන ලදී. එක්වරක් පමණක් මෙම තුවක්කුව ජපන් සබ්මැරීනයකට ප්‍රහාරයක් එල්ල කිරීමට 1942 පෙබරවාරි 7 වැනිදා යොදා ගත්බව සඳහන් වේ. එය තවමත් දැකිය හැක.

පොලිස් ස්ථානය දැනට පිහිටි ගොඩනැ-ගිල්ල මුලින් තනා ඇත්තේ අවිවාහක පිරිමි ගුරුවරුන්ගේ නේවාසිකාගාරයක් ලෙසය. ඊට යාබදව සිංගප්පූරුවෙන් බඳවා ගත් පොලිස් නිලධාරි තිබුණි. දැන් එය වෙළඳ සැල් කිපයකි. 1962 දක්වා සිංගප්පූරු පොලිස් නිලධාරිහු දිවයිනේ සාමය රැකීමේ නියුතුව සිටියහ. 1963 ද වත්මන් පොලිස් ස්ථානය විවෘත කරනු ලැබීය.

පැරණි රෝහල 1901 දී ගොඩනගන ලද්දකි. දිවයිනේ සිටි කම්කරු පිරිසෙන් භාගයක්ම පමණ විටමින් ඌණතාවය නිසා වැළදෙන බෙරි-බෙරි රෝගයෙන් මිය ගිය බවද එම රෝගීන්ට ප්‍රතිකාර කිරීමට මේ රෝහල තනන ලද බවද වාර්තාවේ. සි හැර ශුද්ධ කරන ලද සුදු හාල් ආහාරයට ගැනීම බෙරිබෙරි රෝගය වැලදීමට හේතුව විය. 1988 දී විශාල කුණාටුවකින් හානියට පත් මේ ගොඩනැ-ගිල්ල යළි පිළිසකර කර උරුම ගොඩනැගිල්ලක් ලෙස ප්‍රකාශයට පත්කර රෝහල නව ගොඩනැ-ගිල්ලකට ගෙන යනු ලැබීය.

දිවයිනේ පැරණිතම ගොඩනැගිල්ලක ගරා වැටෙන බිත්ති හා අත්තිවාරම් දැකිය හැක. මෙය 1930 දක්වා කම්කරුවන් සැපයූ ධනවත් කොන්ත්‍රාත්කරුවකු වු ONE BOON TAT විසින් කුලීකරුවන් හා ඕවර්සියර් සඳහා වාසස්ථානය ලෙස ඉදිකරන ලද නේවාසිකාගාරයකි. අද සුපිරිවෙලද සැල තිබෙන ගොඩනැගිල්ල පිහිටි තැන කන්‍යාවන්ගේ බලකොටු (VIRGINS CASTLE) නමින් හැදින්වුණු දෙමහල් ගොඩනැගිල්ලක් විය. 1960 දශකය දක්වා තනිකඩ ගුරුවරියන් හා හෙදියන් වාසය කලේ එහිය. කෲර ලෙස කම්කරුවන්ට සැලකීම නිසා ඕවර්සියර් වරුන් දෙදෙනකු තවුකරුවන් විසින් ඝාතනය කරන ලද බව වාර්තාවේ.

පොස්පේට් නැව්වලට පැටවීමේ ප්‍රධාන වාප්පුව ලෙස 1912-16 අතර ඉදි කෙරුණු ත්‍රිකෝණාකාර ජැටිය 1950 දක්වා ප්‍රයෝජනයට ගැනිනි. 1930 ගණන් වලදී හමා ආ කුණාටුවක් නිසා ඉසබෙල් වෙරලේ ඉදිවෙමින් තිබු වාප්පුව හානියට පත්වීමෙන්, පොස්පේට් පැටවීමට බක්කල් යොදා ගන්නා ලදී. වඩාත් නවීන වාප්පුවක් 1963 දී ඉදිකරනු ලැබීය.

දූපතේ පිහිටි චීන බෞද්ධ පූජ්‍ය ස්ථාන අතුරින් DI ZHANE PUSA විහාරයට වැදගත් තැනක් හිමිවේ. මෙහි සිටින බෞද්ධයන් බහුතරය මහායාන බුද්ධාගම අදහන්නෝ ය. බුදුන් වහන්සේගේ තෙමඟුල සිදු වු වෙසක් දිනය එහි මහත් හරසරන් සැමරේ. බුද්ධගයාවෙ ශ්‍රී මහා බෝධියෙන් ගෙනා අංකුරයකින් පැල කරන ලද බෝධි වෘක්ෂයක් මෙහි පිහිටා තිබේ. මහායාන බෞද්ධ සංගමය මෙම විහාරස්ථානය පාලනය කරයි. නව සඳහා පුරසද දිනවල ආගමික පූජා ඇතුළු බොහෝ බෞද්ධ උත්සව KUAN LIN දර්ශන සේනා සභාවේ නිතිපතා පැවත්වේ.

සමෘද්ධියේ දෙවයන්ට කැප වුණු TAK PAKKONE විහාරය තවත් පූජනීය ස්ථානයකි. රෝගාබාධ දුරුකිරීම, අනතුරු වැලැක්වීම ආදිය සඳහා මෙතැනට භාරහාර වෙති.

මැලේ ජාතිකයන්ගේ වන්දනා මාන කටයුතු සඳහා 1950 ගණන් වල දී ඉදි කළ මුස්ලිම් පල්ලියක් මෙහි ඇත. සෑම සිකුරාදාවකම පස්වතාවක් යාඥා කිරීම සඳහා මැලේ ජාතිනයෝ මෙහි පැමිණෙති.

FLYING FISH COVE නමැති ස්ථානයට ඉහළින් කතෝලික දේවස්ථානය පිහිටියේය.

1887 දි මෙහි පැමිණ FLYING FISH නෞකවේ තම මෙදෙනට තබා ඇත. දිවයිනේ ප්‍රථම මිනිස් වාසස්ථාන සමූහය ඉදිකරන ලද්දේ මෙහිය.

මේ දිවයිනේ සිට ඉන්දුනිසීයාවේ ජාවා දූපතට ඇත්තේ කි.මී. 360 ක පමණ දුරකි. ලෝකයේ, මුහුදේ ගැඹුරුතම ස්ථාන අතුරින් එකක් පිහිටා ඇත්තේ ජාවා මුහුදේය. මෙම දූපතේ සමහර තැන්වල වෙරළින් මීටර් 100ක් ඔබ්බට මුහුදේ ගැඹුර මීටර් 900ක් 1200ක් අතර වෙයි. මෙහි ස්නානය කිරීම භයානකය. රැළි සහිත මුහුදු වෙරළක් යැයි කිව හැකි තැන් ඇත්තේ ඉතා ස්වල්පයකි.

දැනට මේ දිවයින පොස්පේට් කැණිම් කර්මාන්තයට වඩා ඔස්ට්‍රේලියාවට මුහුදින් එන නීති තීපයක් පිහිටුවා තිබෙන ස්ථානයක් ලෙස වැදගත් වේ. මෙහි රුවා සිටින වැඩිදෙනා අ ජාතිකයෙන්ය. හලාවත ප්‍රදේශයේ සිට බෝට්ටුවකින් පැමිණ ශ්‍රී ලාංකික-සිංහල-පිරිමි දස දෙනෙක්ද මේ දිවයිනේ දැනට රඳවා සිටිති.




